ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2213/38 - 2021 පෙබරවාරි මස 03 වැනි බදාදා - 2021.02.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 10/2017(III)

**2017 අංක 12 දරන විදේශ විනිමය පනත**

2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 5 වන, 7 වන සහ 8 වන වගන්ති සමඟ කියවිය යුතු එකී පනතේ 29 වන වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

**මහින්ද රාජපක්ෂ,**
මුදල් අමාත්‍ය.

2021 පෙබරවාරි මස 03 වැනි දින,
කොළඹ දී ය.

**නියෝග**

**1.** මේ නියෝග 2021 අංක 5 දරන විදේශ විනිමය (විදේශ විනිමය ගනුදෙනුවල නිරතවීමේ කාර්යය සඳහා ගිණුම් විවෘත කිරීම සහ පවත්වාගෙන යාම) නියෝග යනුවෙන් හඳුන්වනු ලබන අතර 2021 මාර්තු මස 22 වන දින සිට ක්‍රියාත්මක විය යුතුය.

*I* **වන කොටස**

**ගිණුම් විවෘත කර පවත්වාගෙන යාම සඳහා වන බලය**

**2.** (1) විදේශ විනිමය ගනුදෙනුවල නිරත වීමේ කාර්යය සඳහා යම් තැනැත්තකුගේ නමින් 5 වන නියෝගයේ නිශ්චිතව දක්වා ඇති විදේශ විනිමය ගිණුම් හෝ ශ්‍රී ලංකා රුපියල් ගිණුම් විවෘත කර පවත්වාගෙන යාම සඳහා පනතේ 4 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති ප්‍රමාණයට බලයලත් වෙළෙන්දකුට හෝ පරිසීමිත වෙළෙන්දකුට බලය තිබිය යුතු ය.

(2) බලයලත් වෙළෙන්දකු හෝ පරිසීමිත වෙළෙන්දකු විසින් මේ නියෝග යටතේ ගනුදෙනු සිදු කිරීමේ දී, සෑම විටම පනතේ 9 වන වගන්තිය යටතේ, කලින් කලට, මහ බැංකුව විසින්, ඒ සම්බන්ධයෙන් නිකුත් කරනු ලබන විධානවලට අනුකූලවීම අවශ්‍ය වන්නේ ය.

**3.** ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික, නියාමනය කරන ලද යම් මූල්‍ය ආයතනයක් විසින් ගනුදෙනු පියවීම සඳහා ශ්‍රී ලංකාවේ යම් බලයලත් වෙළෙන්දකු සමග විදේශ විනිමය ගිණුම් සහ ශ්‍රී ලංකා රුපියල් ගිණුම් (වොස්ට්‍රෝ (Vostro) ගිණුම්) විවෘත කර පවත්වාගෙන යනු ලැබිය හැකි ය.

**4.** බලයත් වෙළෙන්දකු විසින්, එම බලයලත් වෙළෙන්දා විසින් වෙනත් රටවල විදේශ විනිමය ගනුදෙනු කාර්යක්ෂමව පියවීම සඳහා, පහසුකම් සැලසීම පිණිස, ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාගත කරනු ලැබූ බැංකුවක් සමඟ විදේශ විනිමය ගිණුම් (නොස්ට්‍රෝ (Nostro))ගිණුම්) විවෘත කර පවත්වාගෙන යනු ලැබිය හැකි ය.

## II වන කොටස

### ගිණුම් වර්ග

**5.** පනතේ 4 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති ප්‍රමාණයට බලයලත් වෙළෙන්දකු විසින් හෝ පරිසීමිත වෙළෙන්දකු විසින් පහත දැක්වෙන ගිණුම් වර්ග විවෘත කර පවත්වාගෙන යනු ලැබිය හැකි ය -

(අ) පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් (PFCAs)

(ආ) ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් (BFCAs)

(ඇ) රාජ්‍ය තාන්ත්‍රික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් (DFCAs)

(ඈ) රාජ්‍ය තාන්ත්‍රික රුපියල් ගිණුම් (DRAs)

(ඉ) අනේවාසික රුපියල් ගිණුම් (NRRAs)

(ඊ) ප්‍රතිමුඛ ආයෝජන ගිණුම් (OIAs)

(උ) ආමුඛ ආයෝජන ගිණුම් (IIAs)

(ඌ) ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුම් (CTRAs)

(එ) විගාමිකයන්ගේ ප්‍රේෂණය කළ හැකි ආදායම් ගිණුම් (ERIAs)

(ඒ) විදේශීය වාණිජ ණය ගැනීමේ ගිණුම් (ECBAs)

(ඔ) පනතේ විධිවිධාන යටතේ මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන විධාන මගින් අවසර ලබා දෙනු ලැබිය හැකි බැර සහ හර සීමාවලට යටත්ව, විශේෂ විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් (SFCAs)

**6.** බලපත්‍රලාභී වාණිජ බැංකු සම්බන්ධයෙන් වන විට, 5 වන නියෝගයේ නිශ්චිතව දක්වා ඇති ගිණුම් එම බැංකුවල දේශීය බැංකු ඒකකවල විවෘත කර පවත්වාගෙන යනු ලැබිය යුතු ය.

**7.** යම් තැනැත්තකු මේ නියෝගවල උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති පරිදි යම් ගිණුමක් විවෘත කිරීමට සුදුසුකම්ලත් අයකු නොවන අවස්ථාවකදී, එවන් කිසිදු තැනැත්තකු විසින් 5 වන නියෝගයේ නිශ්චිතව දක්වා ඇති යම් ගිණුමක් විවෘත කරනු නොලැබිය යුතු ය.

**8.** (1) 5 වන නියෝගයේ නිශ්චිතව දක්වා ඇති එක් එක් ගිණුම් වර්ගය විවෘත කර පවත්වාගෙන යාම සඳහා වන උපමාන සහ එම ගිණුම් සඳහා වන අවසරලත් හර සහ බැර පනතේ 9 වන වගන්තිය යටතේ කලින් කලට මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන විධානවල නිශ්චිතව දක්වනු ලබන පරිදි විය යුතු ය.

(2) 5 වන නියෝගයේ නිශ්චිතව දක්වා ඇති ගිණුම් විවෘත කර පවත්වාගෙන යාමට අපේක්ෂා කරන තැනැත්තන්, පනතේ 9 වන වගන්තිය යටතේ මහ බැංකුව විසින් කලින් කලට නිකුත් කරනු ලබන විධානවල නිශ්චිතව දක්වා ඇති උපමාන යටතේ එම ගිණුම්

විවෘත කර පවත්වාගෙන යාමට සුදුසුකම්ලත් තැනැත්තන් බවට නිශ්චය කර ගැනීම සඳහා බලයලත් වෙළෙන්දකු හෝ පරිසීමිත වෙළෙන්දකු විසින් නිසි උද්යෝගය සහ සාධාරණ සැලකිල්ල දක්වනු ලැබිය යුතු ය.

**9.** (1) මේ නියෝග යටතේ විදේශ විනිමයෙන් වූ ගනුදෙනුවල නිරත වන සෑම බලයලත් වෙළෙන්දකු හෝ පරිසීමිත වෙළෙන්දකු විසින් ම -

(අ) ගනුදෙනුව සිදු කරනු ලබන තැනැත්තාගේ සද්භාවය; සහ

(ආ) එම ගනුදෙනුව මේ නියෝගවලට අනුකූලව සිදු කර ඇති බව,

ඒ සම්බන්ධයෙන් වූ ලේඛනගත සාක්ෂි ලබා ගැනීම මගින් නිශ්චය කරනු ලැබිය යුතු ය.

(2) මේ නියෝග යටතේ විදේශ විනිමයෙන් වූ ගනුදෙනුවල නිරත සෑම තැනැත්තකු විසින් ම (1) වන ඡේදයේ කාර්යය සඳහා එම බලයලත් වෙළෙන්දා හෝ පරිසීමිත වෙළෙන්දා වෙත අවශ්‍ය සියලු ලේඛනගත සාක්ෂි සපයනු ලැබිය යුතු ය.

(3) මේ නියෝග යටතේ එම විදේශ විනිමයෙන් වූ ගනුදෙනු සිදු කිරීමේ දී සෑම බලයලත් වෙළෙන්දකු හෝ පරිසීමිත වෙළෙන්දකු විසින් ම පූර්ණ නිසි උද්යෝගයෙන් කටයුතු කරනු ලැබිය යුතු ය.

**10.** මේ නියෝගවලට අනුකූල වීමට අපොහොසත් වන යම් බලයලත් වෙළෙන්දකු, පරිසීමිත වෙළෙන්දකු හෝ බලයලත් වෙළෙන්දකු හෝ පරිසීමිත වෙළෙන්දකු නොවන වෙනත් යම් තැනැත්තකු සම්බන්ධයෙන් පනතේ විධිවිධාන යටතේ මහ බැංකුව විසින් අවශ්‍ය වන බවට සලකනු ලැබිය හැකි යම් ක්‍රියාමාර්ගයක් ගනු ලැබිය හැකි ය.

**11.** සෑම බලයලත් වෙළෙන්දකු, පරිසීමිත වෙළෙන්දකු හෝ එවන් බලයලත් වෙළෙන්දකු හෝ පරිසීමිත වෙළෙන්දකු හරහා විදේශ විනිමයෙන් වූ ගනුදෙනුවල යෙදෙන යම් තැනැත්තකු, එම ගනුදෙනු මේ නියෝග යටතේ අවසරලත් ගනුදෙනු වන බවට ඔප්පු කිරීම සඳහා වන සියලු තොරතුරු සහ ලේඛනගත සාක්ෂි එම ගනුදෙනුවේ දින සිට වසර හයක කාලසීමාවක් සඳහා රඳවා තබා ගනු ලැබිය යුතු ය.

## III වන කොටස

### දැනට පවත්නා ගිණුම් නැවත නම් කිරීම ආදිය

**12.** (1) ඉවත් කරන ලද විනිමය පාලන පනතේ විධිවිධාන යටතේ විවෘත කරන ලද, විදේශ බැංකුවල සහ විදේශ විනිමය තැන්පතු ස්ථානවල ඇති සියලු අනේවාසික රුපියල් ගිණුම්, 3 වන නියෝගයේ නිශ්චිතව දක්වා ඇති පරිදි ශ්‍රී ලංකා රුපියල්වලින් වූ වොස්ට්‍රෝ ගිණුම් ලෙස අඛණ්ඩව ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

(2) දැනට පවත්නා සියලු නේවාසික ආගන්තුක යෝජනා ක්‍රම විශේෂ ගිණුම් සහ ජ්‍යෙෂ්ඨ විදේශීය ජාතිකයන්ගේ විශේෂ ගිණුම්, නැවත නම් කිරීමකින් තොරව 2017 නොවැම්බර් මස 17 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි අඛණ්ඩව ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

(3) පිළිවෙලින්, ශ්‍රී ලංකාවෙන් පිටත ලියාපදිංචි කරන ලද විදේශීය ආයතන සහ සමාගම් විසින් සහ විගාමිකයන් හැර ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික විදේශයන් හි සේවයේ නියුක්ත ශ්‍රී ලාංකිකයන් විසින් පවත්වාගෙන යනු ලබන දැනට පවත්නා සියලු ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුම්, පිළිවෙලින්, අනේවාසික රුපියල් ගිණුම් සහ ශ්‍රී ලංකා රුපියල් ගිණුම් ලෙස නැවත නම් කර අඛණ්ඩව ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

(4) ඉවත් කරන ලද විනිමය පාලන පනතේ විධිවිධාන යටතේ 2010 මැයි මස 7 වන දින සිට 2017 ජුලි මස 5 වන දින දක්වා වූ කාලසීමාව තුළ දී ශ්‍රී ලංකාව තුළ නේවාසික සුදුසුකම්ලත් සේවා යෝජකයන් සහ සේවා නියුක්තිකයන් විසින් විවෘත කරන ලද දැනට පවත්නා සියලු ජාත්‍යන්තර සේවා සැපයුම්කරුවන් සහ ඔවුන්ගේ සේවානියුක්තිකයන් සඳහා වන විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්, 2017 නොවැම්බර් මස 20 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි, පිළිවෙලින්, ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් සහ පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් ලෙස ක්‍රියාත්මකව පවතින බවට සලකනු ලැබිය යුතු ය.

(5) ඉවත් කරන ලද විනිමය පාලන පනතේ විධිවිධාන යටතේ විවෘත කරන ලද, ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන රාජ්‍ය නොවන සංවිධානවල දැනට පවත්නා සියලු පශ්චාත් සුනාමි ආමුඛ ප්‍රේෂණ ගිණුම්, ශ්‍රී ලංකා රුපියල් ගිණුම් ලෙස අඛණ්ඩව ක්‍රියාත්මක වනු ලැබිය යුතු ය.

**13.** විගාමිකයන් හැර ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික ශ්‍රී ලාංකික ජාතිකයන් විසින්, ශ්‍රී ලංකාව තුළ සිදු කරන ආයෝජන ඇතුළුව දේශීය ගනුදෙනු සඳහා පමණක් බලයලත් වෙළෙන්දන් හෝ පරිසීමිත වෙළෙන්දන් සමග ශ්‍රී ලංකා රුපියල්වලින් වූ ජංගම, ඉතිරි කිරීමේ හෝ කාලීන තැන්පතු ගිණුම් විවෘත කර පවත්වාගෙන යනු ලැබිය හැකි ය.

**14.** (1) මේ නියෝගවල කාර්යය සඳහා "නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදල්" යන්නෙන් -

(අ) එක්සත් ජනපද ඩොලර්;

(ආ) යුරෝ;

(ඇ) ස්ටර්ලිං පවුම්;

(ඈ) ඕස්ට්‍රේලියානු ඩොලර්;

(ඉ) සිංගප්පූරු ඩොලර්;

(ඊ) ස්වීඩන ක්‍රෝනර්;

(උ) ස්විස් ෆ්‍රෑන්ක්;

(ඌ) කැනේඩියානු ඩොලර්;

(එ) හොංකොං ඩොලර්;

(ඒ) ජපන් යෙන්;

(ඔ) ඩෙන්මාර්ක ක්‍රෝනර්;

(ඕ) නෝර්වීජියානු ක්‍රෝනර්;

(ක) චීන රෙන්මින්බි; සහ

(ග) නවසීලන්ත ඩොලර්,

අදහස් වේ.

(2) මහ බැංකුව විසින්, පනතේ 9 වන වගන්තිය යටතේ ඒ සම්බන්ධයෙන් නිකුත් කරනු ලබන විධාන මගින් කලින් කලට (1) වන ඡේදයේ නිශ්චිතව දක්වා ඇති නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදල් සංශෝධනය කිරීම, වෙනස් කිරීම හෝ එකතු කිරීම සිදු කරනු ලැබිය හැකි ය.

**15.** 2017 නොවැම්බර් මස 17 වන දින අංක 2045/56 දරන *අතිවිශෙෂ ගැසට්පත්‍රයේ* පළ කරන ලද, 2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ සාදන ලද 2017 අංක 2 දරන විදේශ විනිමය (ප්‍රාග්ධන ගනුදෙනුවල යෙදීමේ කාර්යය සඳහා ගිණුම් විවෘත කිරීම සහ පවත්වාගෙන යාම) නියෝග සහ 2017 අංක 3 දරන විදේශ විනිමය (විදේශ විනිමය ගිණුම් විවෘත කිරීමේ හා පවත්වාගෙන යාමේ) නියෝග ඒ යටතේ කරන ලද කිසිවකට අගතියක් නොමැතිව, මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ:

එසේ වුව ද, ඉහත සඳහන් නියෝග පරිච්ඡින්න කිරීම නොතකා, 2020 දෙසැම්බර් මස 18 වන දින අංක 2206/25 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද නියමය මගින් වලංගු කාල සීමාව දීර්ඝ කරන ලද, 2020 ජූලි මස 2 වන දින අංක 2182/37 දරන ගැසට් පත්‍රයේ පළකරන ලද සහ 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 22 වන වගන්තිය යටතේ කරන ලද නියමය, එසේ දීර්ඝ කරන ලද කාල සීමාව තුළ දී බල පැවැත්විය විය යුතු ය.

**16.** මෙම නියෝගවල කාර්ය සඳහා -

"පනත" යන්නෙන්, 2017 අංක 12 දරන විදේශ විනිමය පනත අදහස් වේ;

"බලයලත් වෙළෙන්දා" යන්නට 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ දී ඇති අර්ථයම තිබිය යුතු ය;

"පරිසීමිත වෙළෙන්දා" යන්නට 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ දී ඇති අර්ථයම තිබිය යුතු ය;

"මහ බැංකුව" යන්නට 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ ඊට දී ඇති අර්ථයම තිබිය යුතු ය;

"රාජ්‍ය තාන්ත්‍රික දූත මණ්ඩලය" යන්නෙන් තානාපති කාර්යාලයක්, මහ කොමසාරිස් කාර්යාලයක්, කොන්සල් කාර්යාලයක්, එක්සත් ජාතීන්ගේ සංවිධානයේ නිත්‍ය දූත මණ්ඩලයක්, යුරෝපා කොමිෂන් සභාවේ යුරෝපා සංගම් නියෝජිත පිරිසක්, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, ප්‍රතිසංවිධානය සහ සංවර්ධනය සඳහා වන ජාත්‍යන්තර බැංකුව, ආසියානු සංවර්ධන බැංකුව හෝ කලින් කලට විදේශ කටයුතු අමාත්‍යාංශයේ (වි. ක. අ.) පිළිවෙත් (protocol) අංශය විසින් රාජ්‍ය තාන්ත්‍රික දූත මණ්ඩලයක් ලෙස පිළිගෙන ඇති ඒ හා සමාන වෙනත් යම් සංවිධානයක් අදහස් වේ;

"රාජ්‍ය තාන්ත්‍රික කාර්ය මණ්ඩලය" යන්නෙන් රාජ්‍ය තාන්ත්‍රික දූත මණ්ඩලයක් මගින් නියෝජනය වන්නා වූ විදේශ රටක පුරවැසියන් අදහස් වේ;

"විගාමිකයා" යන්නෙන් 2021 පෙබරවාරි මස 03 දිනැති අංක 2213/36 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2021 අංක 3 දරන විදේශ විනිමය (විගාමිකයන් විසින් අරමුදල් ප්‍රේෂණය කිරීම) නියෝගවල නිශ්චිතව දක්වා ඇති විගාමිකයකු අදහස් වේ;

"බලපත්‍රලාභී වාණිජ බැංකුව" යන්නට 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ ඊට දී ඇති අර්ථයම තිබිය යුතු ය;

"තැනැත්තා" යන්නට, 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ ඊට දී ඇති අර්ථයම තිබිය යුතු ය;

"නියාමනය කරන ලද මූල්‍ය ආයතනය" යන්නෙන් විදේශ රටක යම් නීතියක් යටතේ නියාමනය කරන ලද මූල්‍ය ආයතනයක් අදහස් වේ;

"ඉවත්කරන ලද විනිමය පාලන පනත" යන්නෙන් 2017 අංක 12 දරන විදේශ විනිමය පනත මගින් ඉවත් කරන ලද (423 වන අධිකාරය වූ) විනිමය පාලන පනත අදහස් වේ.

(7 වන නියෝගය)

**උපලේඛනය**

**ගිණුම් විවෘත කිරීමට සුදුසුකම්ලත් තැනැත්තන්**

1. **පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් (PFCAs)**

(1) බාලවයස්කරුවකු ද ඇතුළුව ශ්‍රී ලාංකික ජාතිකයකු වන පුද්ගලයකු;

(2) බාලවයස්කරුවකු ද ඇතුළුව ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසිකයකු වන ශ්‍රී ලාංකික සම්භවයක් ඇති පුද්ගලයකු;

(3) ශ්‍රී ලංකාවේ නේවාසික විජාතිකයෙකු;

(4) ශ්‍රී ලංකාව වෙත තාවකාලිකව පැමිණ සිටින හෝ ශ්‍රී ලංකාව වෙත පැමිණීමේ චේතනාවෙන් සිටින විජාතිකයකු; සහ

(5) මියගිය තැනැත්තකුගේ බූදලය අද්මිනිස්ත්‍රාසි කිරීම සම්පූර්ණ කරන තෙක්, බලයලත් වෙළෙන්දකු හෝ පරිසීමිත වෙළෙන්දකු සමග පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමක් පවත්වාගෙන යනු ලැබූ, මිය ගිය තැනැත්තකුගේ බූදලයේ අද්මින්ස්ත්‍රාසිකරු හෝ පොල්මඃකරු;

2. **ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් (BFCAs)**

(1) ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික තැනැත්තකුගෙන් විදේශ විනිමය උපයන්නා වූ ශ්‍රී ලංකාවේ නේවාසික පහත දැක්වෙන තැනැත්තන්-

(අ) ශ්‍රී ලාංකාවේ නේවාසික පුද්ගලයකු;

(ආ) හිමිකරු හෝ බහුතර හවුල්කරුවන් ශ්‍රී ලංකාවේ නේවාසිකයන් වන අවස්ථාවකදී ශ්‍රී ලංකාවේ ලියාපදිංචි තනි පුද්ගල ව්‍යාපාරයක් හෝ හවුල් ව්‍යාපාරයක් (හවුල්කරුවන් දෙදෙනකු සිටින හවුල් ව්‍යාපාරයක් වන අවස්ථාවක දී, අවම වශයෙන් එක් හවුල්කරුවකු ශ්‍රී ලංකාවේ නේවාසිකයකු විය යුතු ය);

ඇ) ශ්‍රී ලංකාවේ සංස්ථාගත කරන ලද සමාගමක්;

(ඈ) 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ විදේශ සමාගමක් ලෙස ලියාපදිංචි කරන ලද ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාගත කරන ලද සමාගමක්;

(ඉ) අදාළ රේඛීය අමාත්‍යංශයේ ලේකම්වරයාගේ හෝ අදාළ අධිකාරියේ නිර්දේශය සහිත රාජ්‍ය ආයතනයක්;

(ඊ) මියගිය තැනැත්තකුගේ බූදලය අද්මිනිස්ත්‍රාසි කිරීම සම්පූර්ණ කරන තෙක්, බලයලත් වෙළෙන්දකු හෝ පරිසීමිත වෙළෙන්දකු සමග ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමක් පවත්වාගෙන යනු ලැබූ මිය ගිය තැනැත්තකුගේ බූදලයේ අද්මින්ස්ත්‍රාසිකරු හෝ පොල්මඃකරු; සහ

(උ) නඩු කටයුතු අවසන් වන තෙක්, බලයලත් වෙළෙන්දකු හෝ පරිසීමිත වෙළෙන්දකු සමග ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමක් පවත්වාගෙන යනු ලැබූ ලැබුම්කරුවකු හෝ ඇවරකරුවකු.

(2) රාජ්‍ය නොවන සංවිධානයකට ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමක් විවෘත කිරීමට සහ පවත්වාගෙන යාමට අවසර ලබා නොදිය යුතු ය.

**3 . රාජ්‍ය තාන්ත්‍රික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් (DFCAs)**

(1) විදේශ රාජ්‍ය තාන්ත්‍රික දූත මණ්ඩල;

(2) ආගමන හා විගමන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන නේවාසික වීසා ලබා ගැනීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කරනු ලැබූ යම් රාජ්‍ය තාන්ත්‍රික කාර්ය මණ්ඩලයක්; සහ

(3) ආගමන හා විගමන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන නේවාසික වීසා ලබා ගැනීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කරනු ලැබූ ශ්‍රී ලංකාවේ රාජ්‍ය තාන්ත්‍රික කාර්ය මණ්ඩලයක පවුල් සාමාජිකයන්.

**4. රාජ්‍ය තාන්ත්‍රික රුපියල් ගිණුම් (DRAs)**

(1) විදේශ රාජ්‍ය තාන්ත්‍රික දූත මණ්ඩල;

(2) ආගමන හා විගමන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන නේවාසික වීසා ලබා ගැනීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කරනු ලැබූ යම් රාජ්‍ය තාන්ත්‍රික කාර්ය මණ්ඩලයක්; සහ

(3) ආගමන හා විගමන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන නේවාසික වීසා ලබා ගැනීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කරනු ලැබූ ශ්‍රී ලංකාවේ රාජ්‍ය තාන්ත්‍රික කාර්ය මණ්ඩලයක පවුල් සාමාජිකයන්.

**5. අනේවාසික රුපියල් ගිණුම් (NRRAs)**

(1) ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාගත කරන ලද හෝ පිහිටුවන ලද ව්‍යාපාර ආයතන සහ සමාගම්;

(2) විගාමිකයන්; සහ

(3) මහ බැංකුව විසින් කලින් කලට බලය ලබා දෙනු ලැබිය හැකි වෙනත් යම් තැනැත්තකු.

02 - 390

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.